## සිංහල අංශයේ ස්ථිර ආචාර්ය මණ්ඩලය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමී කෝපරහේවා**
අංශ ප්‍රධාන
බී.ඒ.ගෞරව (කොළඹ), එම්.ඒ.(ලැන්කැස්ටර්), එම්.ෆිල් (පේරාදෙණිය), පි.එච්.ඩී. (කේම්බ්‍රිජ්)

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආනන්ද තිස්සකුමාර**
බී.ඒ.ගෞරව(කොළඹ), පි.එච්.ඩී. (කොළඹ)

**මහාචාර්ය සරත් විජේසූරිය**
බී.ඒ.ගෞරව (කොළඹ), එම්.ෆිල් (කොළඹ)

**මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි**
බී.ඒ.ගෞරව (කොළඹ), එම්.ෆිල් (කොළඹ)

**මහාචාර්ය ලතා ගුරුසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව(කොළඹ), එම්.ෆිල් (කොළඹ) පි.එච්.ඩී. (කොළඹ)

**ආචාර්ය ප්‍රේමසිරි නාගසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව (කොළඹ), එම්. ඒ. (කැලණිය), එම්.ෆිල් (කොළඹ)
පශ්චාත් උපාධි ඩිප්ලෝමා-උපදේශනය (කොළඹ)
පී. එච්. ඩී (කැලණිය)

**ආචාර්ය කුමුදු කරුණාරත්න**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව (කොළඹ), එම්.ඒ (කැලණිය), එම්.ෆිල් (කොළඹ) පී.එච්.ඩි (ශ්‍රී ජයවර්ධනපුර)

**ආචාර්ය ජයන්ති බණ්ඩාර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව (කොළඹ), ජනමාධ්‍ය ඩිප්ලෝමා (කොළඹ),
එම්.ඒ. (කොළඹ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කැලණිය)

**ආචාර්ය ක්‍රිෂාන්ත ෆෙඩ්රික්ස්**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව (කොළඹ), එම්.ඒ. (කැලණිය),
එම්.ඒ. (කැලිෆෝනියා) පී.එච්.ඩි. (ටෙක්සාස්)

**ආචාර්ය රංජිත් සේනානායක**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව (රුහුණ), එම්.ෆිල් (පේරාදෙණිය)
පි.එච්.ඩී. (ශ්‍රී ජයවර්ධනපුර)

**කල්‍යාණි විජේසුන්දර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව (කොළඹ) එම්. ඒ. (කැලණිය)

**ආචාර්ය දීපචන්දි අබේසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බී.ඒ.ගෞරව (කැලණිය), එම්.ඒ. (කැලණිය)
පී. එච්. ඩී (කැලණිය)

**අචින්ත්‍ය බණ්ඩාර**
කථිකාචාර්ය
බී.ඒ.ගෞරව(කොළඹ), එම්.ඒ (ටෙක්සාස්)

**ඔසද ගුණරත්න**
කථිකාචාර්ය
බී.ඒ.ගෞරව(කොළඹ), එම්.ඒ (කොළඹ)

විමසීම්

---

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සඳගෝමී කෝපරහේවා
පාඨමාලා සම්බන්ධීකාරක,
සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය.
දුර. 011-2500453 (කාර්යාල)/ 0718381142 (ජංගම)

---

කොළඹ විශ්වවිද්‍යාලය

# සිංහල ශාස්ත්‍රපති පාඨමාලාව

# Master of Sinhala

(SLQF Level 9)



සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය මඟින් මේ පශ්චාද් උපාධි පාඨමාලාව ආරම්භ කරනුයේ, ශාස්ත්‍රාලයීය මෙන්ම වෘත්තීය හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිංහල භාෂාව හා සාහිත්‍යයේ ප්‍රමිතීන් සහ භාවිතය උසස් තලයකට නැංවීම අපේක්ෂා කරමිනි. එහෙයින් මේ පශ්චාද් උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන්ට, සිංහල භාෂාව හා සාහිත්‍යය ගවේෂණාත්මක ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමට අවකාශය සැලසෙයි. පාඨමාලා ව්‍යුහය විශේෂයෙන් සකස් කර ඇත්තේ, සිංහල විෂයයෙහි පශ්චාත් උපාධියක් ලබා ගැනීම අරමුණු කර ගත් විද්‍යාර්ථීන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට, ඔවුන් පර්යේෂණ උපාධියකට සූදානම් කිරීමේ අභිලාෂයෙනි.

## පාඨමාලා අරමුණු

- සිංහල භාෂා භාවිතය හා සාහිත්‍ය කෘති ඇගයීමෙහිලා අවශ්‍ය විචාරාත්මක ඥානය හා ශක්‍යතා වර්ධනය කිරීම.
- සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය සම්බන්ධ සමකාලීන ගැටලු සහ නව ප්‍රවණතා හඳුනා ගැනීම සහ අවබෝධය
- සිංහල භාෂාව හා සාහිත්‍යය සම්බන්ධයෙන් ස්වාධීන පර්යේෂණ කටයුතුවල නියුක්ත වීමේ කැමැත්තෙන් සිටින විද්‍යාර්ථීන්ට අවශ්‍ය ශාස්ත්‍රාලයීය ශික්ෂණය සම්පාදනය කිරීම.

## අපේක්ෂිත ප්‍රතිඵල

මේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සාර්ථකව නිම කරන විද්‍යාර්ථීන්ට පහත සඳහන් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමෙහි අවකාශය සැලසේ.

- සිංහල භාෂාව හා සාහිත්‍ය අධ්‍යයනයෙහි ප්‍රධාන සංකල්ප සහ සන්ධිස්ථාන හඳුනාගනී.
- සිංහල භාෂා සාහිත්‍ය විෂයයෙහි ප්‍රධාන ගැටලු සහ ප්‍රවණතා හඳුනා ගැනීමෙහි හා ඒවා විග්‍රහ කිරීමේ යෙදෙයි.
- සිංහල භාෂාව හා සාහිත්‍යයට අදාළ වන පරිදි පර්යේෂණ ක්‍රමවේද හා න්‍යායාත්මක ප්‍රවේශ සම්බන්ධව අවබෝධය ලබයි.

## පාඨමාලා අන්තර්ගතය

| | |
|---|---|
| MAS 101 | නූතන සිංහල භාෂා ව්‍යවහාරය |
| MAS 102 | සම්භාව්‍ය සිංහල සාහිත්‍ය අධ්‍යයනය |
| MAS 103 | සමකාලීන සිංහල සාහිත්‍යය හා නාට්‍ය කලාව |
| MAS 104 | සිංහල සංස්කෘතිය හා කලා ශිල්ප |
| MAS 105 | පර්යේෂණ විධික්‍රම හා ශාස්ත්‍රීය ලේඛනය* |
| MAS 106 | නිබන්ධය |

* මෙම පාඨමාලා ඒකකය ආධාරක පාඨමාලාවක් (Support Course) බැවින් ඒ සඳහා ලිඛිත පරීක්ෂණයක් නොපැවැත්වේ.

## මාධ්‍යය

පාඨමාලා මාධ්‍යය ලෙස සිංහල භාෂාව යොදාගැනෙන අතර, ඊට අදාළ සියලු දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සිංහල භාෂාවෙන් පැවැත්වෙනු ඇත.

## ඉලක්ක කණ්ඩායම

මේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව, තරුණ උපාධිධාරීන්, විශ්වවිද්‍යාලවල කථිකාචාර්යවරුන්, සිංහල ගුරුවරුන්, ජනමාධ්‍යවේදීන්, භාෂා පරිවර්තකයන් හා සිංහල විෂයයෙහි වැඩිදුර අධ්‍යයන හා ගවේෂණ කිරීමට කැමැත්තක් දක්වන විද්‍යාර්ථීන් ඉලක්ක කර ගනී. එසේම, සිංහල පිළිබඳ පර්යේෂණ උපාධියකට සූදානම් වන විද්‍යාර්ථීන්ටද මේ පාඨමාලාව විශේෂයෙන් වැදගත් වනු ඇත.

## සුදුසුකම්

උක්ත පාඨමාලාව සඳහා සහභාගීවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් අවම වශයෙන් පහත සුදුසුකම් අතරෙන් එකක් හෝ සපුරා තිබීම අත්‍යවශ්‍ය සේ සැලකේ.

(i). පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

(ii). ඉහත (i) වගන්තියට සමාන යැයි කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සියලු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

## කාලය

මෙම උපාධි පාඨමාලාව පූර්ණකාලීනව වර්ෂයක කාලයක් පැවැත්වෙන අතර, පැය තුන බැගින් වූ ඉගැන්වීම් සැසි 80කින් (පැය 240) සමන්විත වනු ඇත. අධ්‍යයන වර්ෂය සෙමෙස්තර දෙකකින් යුක්ත ය. රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින හැර සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00-4.00 දක්වා, කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ දී දේශන පැවැත්වේ.

## ඇගයීම් පටිපාටිය

සිංහල ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ඇගයීම් සඳහා, ලිඛිත4 පරීක්ෂණ (60%), පැවරුම් සතරක් (40%)සහ තම පරී-ක්ෂක/සම්බන්ධීකාරක සමඟ සාකච්ඡා කොට තීරණය කර ගන්නා ලද මාතෘකාවක් යටතේ, වචන 15,000 කට නොඅඩු ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

## දේශක කණ්ඩායම

සිංහල අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලය සහ ආරාධිත දේශකවරුන් විසින් දේශන පවත්වනු ලැබේ.

## පාඨමාලා ගාස්තු

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | - | රු. 2,000.00 |
| අධ්‍යයන | - | රු. 105,000.00 |
| පුස්තකාල | - | රු. 1,500.00 |
| විභාග ගාස්තු | - | රු. 1,500.00 |
| එකතුව | - | රු. 110,000.00 |

පුස්තකාල තැන්පතුව - රු. 5,000.00
(නැවත ලබා ගත හැකිය /අනිවාර්ය නොවේ)

## අයදුම් කළ යුතු ආකාරය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශයේ වෙබ් අඩවියෙන් හෝ අධ්‍යයන හා ප්‍රකාශන අංශයෙන් ලබා ගත් අයදුම්පත්‍රය හා **යොමු අංක 304012900007** දරන යොමු අංකය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට බැර වන සේ ගෙවන ලද **රු.1000/-** (අයදුම් පත්‍ර ගාස්තුව) ලදුපත ද සමඟ අදාළ දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න.

සිංහල ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
අධ්‍යයන හා ප්‍රකාශන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය
තැ.පෙ. 1490
කොළඹ 03
https://arts.cmb.ac.lk/sinhala/index.php/m-a-in-sinhala/